# ගැටුම් නිරාකරණයෙහිලා පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ උපයුක්ත මැදිහත්කරණ න්‍යාය (Mediation) පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කරඳගොල්ලේ සෝභිත හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
sksobhitha@busl.ac.lk

කරපික්කඩ සෝභිත හිමි
කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
ksobitha@busl.ac.lk

භාරතීය උපදේශ සාහිත්‍යයෙහි මහාර්ඝ ග්‍රන්ථ ද්වයක් වන පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය නීතිශාස්ත්‍රය හා රාජ්‍ය පාලනය පිළිබඳ ඉගැන්වීම මුඛ්‍යාභිප්‍රාය කොට රචනා කොට ඇත. කෘතීන්හි අන්තර්ගතයට අනුව කථාන්දර සහ ශ්ලෝක උපයෝගී කරගනිමින් නූගත් රාජපුත්‍රයන්ට නීතිශාස්ත්‍රය හා රාජ්‍ය පාලනය පිළිබඳ මාර්ගෝපදේශකත්වය ලබාදෙයි. එමගින් රාජ්‍ය පාලනයේදී ඇති වන ගැටුම් නිරාකරණයට අවශ්‍ය කරන මගපෙන්වීම ද

සිදුකර ඇත. මෙම පර්යේෂණයෙහි අරමුණ වනුයේ පඤ්චතන්ත්‍රයේ හා හිතෝපදේශයේ උපයුක්ත ගැටුම් නිරාකරණයෙහිලා මැදිහත්කරණ න්‍යාය පිළිබඳ තොරතුරු හඳුනාගැනීම යි. රාජ්‍ය පාලනය පිළිබඳ උපදේශ ලබාදෙන කෘතීන් වශයෙන් පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය ගැටුම් නිරාකරණයට මැදිහත්කරණ න්‍යාය උපයෝගි කරගෙන ඇත්තේ කෙසේ ද යන්න පර්යේෂණ ගැටලුව වශයෙන් යොදාගෙන මෙම පර්යේෂණය සිදු කෙරිණ. සංස්කෘත උපදේශ සාහිත්‍යයෙහි ගැටුම් නිරාකරණය සඳහා මැදිහත්කරණය (Mediation) භාවිත කර ඇති අතර නූතන සාම්ප්‍රදායික ක්‍රමවේදයේ දී ද මෙම එළඹුම ගැටුම් නිරාකරණය සඳහා භාවිත කරන බව අවබෝධ කොටගත හැකිවෙයි. ගුණාත්මක පර්යේෂණ විධික්‍රමයට අනුව ග්‍රන්‍ථ පරිශීලනය යටතේ විෂ්ණුශර්මන්ගේ පඤ්චතන්ත්‍රය හා නාරායණශර්මන්ගේ හිතෝපදේශය යන කෘතීන් ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් ද ගැටුම් නිරාකරණ විෂය ක්ෂේත්‍රය විෂයෙහි ලියැ වී ඇති ප්‍රාථමික, ද්විතීයික හා ශාස්ත්‍රීය ලේඛන, සඟරා මෙන්ම විද්වත් විවරණ භාවිත කරමින් ගැටුම් නිරාකරණයෙහිලා මැදිහත්කරණ න්‍යාය (Mediation) පිළිබඳ සංස්කෘත උපදේශ සාහිත්‍යාගත එළඹුම පිළිබඳ අධ්‍යයනය කෙරිණ. ගැටුම් ඇතිවන පාර්ශ්වකරුවන් අතර එකිනෙකා පිළිබඳ අවබෝධය ඇති කොට අදාළ ගැටුම නිරාකරණයට පත් කිරීමටත් ගැටුම් නිරාකරණය සඳහා පිහිට සොයා යා යුතු පුද්ගලයන් හෝ කණ්ඩායම් පිළිබඳ අදාළ පාර්ශ්වයන් දැනුවත් කිරීමටත් මැදිහත්කරණ න්‍යාය උපයෝගී කරගෙන ඇති බව පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශයෙන් හඳුනාගත හැකිය. මෙයින් ගැටුමට මුහුණ දී සිටින පාර්ශ්වකරුවන්ට තම අවශ්‍යතාව තේරුම් ගැනීමට හා එළඹිය හැකි විසඳුම් පිළිබඳ අවබෝධකර ගැනීමට අවශ්‍ය කරන පහසුකම් සැපයීම පිළිබඳ අවධානය යොමු කොට ඇත. ගැටුම් නිරාකරණයට මැදිහත් වන තුන්වන පාර්ශ්වකරු වශයෙන් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක මැදිහත්වීම දැකිය හැකිය. ගැටුම් නිරාකරණය පිළිබඳ නූතන සාම්ප්‍රදායික ප්‍රවේශයේ දී ද උපයුක්ත සංස්කෘත උපදේශ සාහිත්‍යයෙහි තුන්වන පාර්ශ්වකරුවන් යොදාගන්නා ලද ක්‍රමවේදයන් දෙකක් දැකිය හැකි වෙයි.

1. බලාත්කාරයෙන් (Coercive) යුතු මැදිහත්වීම
2. බලාත්කාරයෙන් තොර (Non-Coercive) මැදිහත්වීම

මේ අනුව පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශයෙහි ගැටුම් නිරාකරණයෙහිලා මැදිහත්කරණ න්‍යාය භාවිත වී ඇති බව හඳුනාගත හැකිය. එහෙයින් පඤ්චතන්ත්‍රය හා හිතෝපදේශය හුදු උපදේශාත්මක කෘති පමණක් නොව ගැටුම් නිරාකරණය පිළිබඳ විවිධ ප්‍රවේශයන් අන්තර්ගත කෘතීන් බවත් ඒ පිළිබඳ අධ්‍යයනය කරන පර්යේෂකයන්ට මහඟු තෝතැන්නක් වන බවත් නිගමනය කළ හැක.

ප්‍රමුඛ පද:- උපදේශ සාහිත්‍යය, පඤ්චතන්ත්‍රය, හිතෝපදේශය, මැදිහත්කරණය